

# හරිත ජීවිත

## ලොව හොඳ ම සහ නරක ම රටවල් පෙළගැස්ම

**ඉතාම සුවදායක පරිසරයක් ඇති ස්ථානයක ඔබේ ජීවිතය ගත කළ හැකි නම් එය කෙතරම් අගනේ ද ? ග්ලැසියර් හෝ නිවර්තන වැසි වනාන්තර ඇති ස්ථානයක් පිළිබඳ ඉන් නොහැඟෙයි.**

එසේ නමුත් පාරිසරික වශයෙන් තුලනය වූ ස්ථානයක් යනු පාරාදීසයකි. එය ඉලක්කගත කරමින් ලොව හරිත බවින් ගහණ රටවල් පිළිබඳ දැන් වැඩි අවධානයක් යොමු වී ඇත.

ඒ අනුව ලොව රටවල් 141 අතරින් වඩාත් හරිත සපිරි සුවදායක ලෙස ජීවත්විය හැකි රටවල් නිරීක්ෂණය කෙරෙයි. පාරිසරික සාධක සැලකිල්ලට ගනිමින් ප්‍රධාන කරුණු 5 ක් ඔස්සේ සිදු කළ විශ්ලේෂණ අනුව රටවල් කාණ්ඩ කෙරෙමින් සැකසූ වගුව පහත දක්වා ඇත.

| වායු තත්ත්වය | ජලයේ තත්ත්වය |
|---|---|
| 1. මොල්ඩෝවා | 1. නෝර්වේ |
| 2. උක්රේනය | 2. පින්ලන්තය |
| 3. එක්සත් අරාබි රාජධානිය | 3. අයිස්ලන්තය |
| 8. පින්ලන්තය | 8. ජපානය |
| 15. ඔස්ට්‍රේලියාව | 15. එක්සත් රාජධානිය |
| 61. ජපානය | 43. කාම්බෝජය |
| 76. ද.කොරියාව | 47. මලයාසියාව |
| 79. මලයාසියාව | 58. මියන්මාරය |
| 98. කාම්බෝජය | 81. පිලිපීනය |
| 101. බංග්ලාදේශය | 90. ශ්‍රී ලංකාව |
| 102. ශ්‍රී ලංකාව | 103. බංග්ලාදේශය |
| 108. පාකිස්ථානය | 110. තායිලන්තය |
| 109. තායිලන්තය | 124. චීනය |
| 134. පිලිපීනය | 127. ඉතියෝපියාව |
| 138. ඉන්දියාව | 137. ඉන්දියාව |
| 139. ඉන්දුනිසියාව | 139. පකිස්ථානය |
| 140. චීනය | 140. ඉන්දුනීසියාව |
| 41. ගුවාතමාලාව | 141. මොරොක්කෝව |

| ශක්ති භාවිතය | හරිතාගාර වායු | පාරිසරික සෞඛ්‍යය |
|---|---|---|
| 1. කොංගෝ | 1. චැඩ් | 1. ඔස්ට්‍රියාව |
| 2. භූතානය | 2. කාම්බෝජය | 2. චෙක් ජනරජය |
| 3. ලාඕසය | 3. මාලදිවයින | 3. ස්වීඩනය |
| 20. මියන්මාරය | 8. මියන්මාරය | 10. ජපානය |
| 26. පිලිපීනය | 25. බංග්ලාදේශය | 20. නවසීලන්තය |
| 36. ශ්‍රී ලංකාව | 37. ශ්‍රී ලංකාව | 30. ද.කොරියාව |
| 59. බංග්ලාදේශය | 51. ජපානය | 36. ශ්‍රී ලංකාව |
| 67. පකිස්ථානය | 57. පිලිපීනය | 39. ඔස්ට්‍රේලියාව |
| 79. ජපානය | 72. පකිස්ථානය | 40. මලයාසියාව |
| 80. චීනය | 76. ඉන්දුනීසියාව | 41. තායිලන්තය |
| 86. ඉන්දුනීසියාව | 94. තායිලන්තය | 45. චීනය |
| 96. තායිලන්තය | 96. ඉන්දියාව | 61. ඉන්දුනීසියාව |
| 106. ඇමෙරිකා එ.ජ. | 97. ද.කොරියාව | 76. බංග්ලාදේශය |
| 108. ඔස්ට්‍රේලියාව | 110. මලයාසියාව | 77. ඉන්දියාව |
| 113. මලයාසියාව | 107. ඇමරිකා එ.ජනපදය | 99. මොංගෝලියාව |
| 118. ද.කොරියාව | 112. ඔස්ට්‍රේලියාව | 106. පකිස්ථානය |
| 141. ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ | 113. චීනය | 115. පිලිපීනය |
| | 141. ටර්ක්මෙනිස්ථානය | 141. ටර්ක්මෙනිස්ථානය |

**ඉහත වගුව අනුව, පාරිසරික සහ සමාජ තත්ත්වයන් මත, ලොව විසීමට සුදුසුම සහ හරිත බවින් වැඩිම රටවල්**

1. පින්ලන්තය
2. අයිස්ලන්තය
3. නෝර්වේ
4. ස්වීඩනය
5. ඔස්ට්‍රේලියාව
54. මලයාසියාව
61. තායිලන්තය
66. ශ්‍රී ලංකාව
84. චීනය
87. පිලිපීනය
104. ඉන්දියාව
111. බංග්ලාදේශය
115. පකිස්ථානය
137. චැඩ්
138. බර්කිනා ෆාසෝ
139. සියරාලියොන්
140. නයිගර්
141. ඉතියෝපියාව

ලෝකයේ පිරිසුදුම රටවලට පවා දරුණු පාරිසරික ගැටලු පවතී. වාතය හා ජලය අතින් හොඳම ස්ථානය දිනාගත් පින්ලන්තයට පවා ජලය දූෂණය වීම මඟින් සිදුවන ළදරු රෝග අවම මට්ටමක පවත්වා ගැනීම හා ස්වාභාවික උපද්‍රව පිළිබඳ ගැටලු පවතී.

1962 ජුනි 22 කුයාහෝගා (Cuyahoga) ගඟට (ඇමරිකා එක්සත් ජනපදයේ ඔහියෝ ප්‍රාන්තයේ පිහිටි) ඛනිජ තෙල් එක් වූයේ දුම්රියෙක සිදු වූ ගිනි ගැනීමකිනි. මෙම සිදුවීමෙන් එක් අයකු තුවාල ලත් අතර ඇ.ඩො.50,000 ක අලාභයක් සිදු විය. විශාලතම හානිය සිදු වූයේ අතිවිශාල තෙල් ප්‍රමාණයක් ගංගාවේ මතුපිටට එක් වීමෙනි. මෙය ඇමරිකාවට ප්‍රබල පාරිසරික ගැටලු මතු කරවන්නක් විය. මින් වසර 03 ට පසු එරට, පවිත්‍ර ජලය පිළිබඳ පනතක් (Clean Water act) පනවන ලදී. එසේම වාතය සහ ජලය සුරැකීමට තවත් වැදගත් තීරණ කිහිපයක්ම ගනු ලැබිණි. වායුගෝලය වෙත කාබන්ඩයොක්සයිඩ් පිටකිරීම අධික වීමෙන් බොහෝ පාරිසරික ගැටලු මතුවීම ලෝකයටම පොදු වූවකි. මෙම තත්ත්වය 1990 දී පැවතියාට වඩා 2005 වන විට 22% න් ඉහළ ගොස් ඇත.

බොහොමයක් රටවල් මෙම වායු දූෂණය අවම කරගැනීමට සිය අවධානය යොමුකර තිබේ. ඒ අනුව ඇමෙරිකානු කොන්ග්‍රසය පෙන්වා දෙන්නේ, 1978 දී ගැලුමකට සැතපුම් 18ක්ව පැවැති ඉන්ධන ධාරිතාව 1985 වනවිට ගැලුමකට සැතපුම් 27.5 දක්වා වර්ධනය කිරීමට හැකි වූ බවයි.

මෙලෙස ශක්ති කාර්යක්ෂමතාව ඉහළ දැමීමෙන් ඉන්ධන දහනය අවම කළ හැකි ය. එසේම විකල්ප ශක්ති ප්‍රභවයන් භාවිතයට ද යොමු විය යුතු ය.



## ලොව, හරිත සපිරි වාසයට සුදුසු ම නගර

**හොඳම නගර**

1. ස්ටොක් හෝම්
2. ඔස්ලෝ
3. මියුනච්
4. පැරිස්
5. ප්‍රෑන්ක්ෆර්ට්

**නුසුදුසු ම නගර**

68. බැංකොක්
69. ග්වාන්සුයි
70. බුම්බායි
71. සැන්හයි
72. බීජිං

**ආසියාවේ වෙනත් නගර**

18. හොංකොං
20. ටෝකියෝ
45. සිංගප්පූරුව
49. ක්වාලාලම්පූර්
52. සෝල්
67. තායි පේ

සංවර්ධිත රටවල මිනිසුන් ප්‍රධාන නගරයන්ගෙන් මිදී උප නගරවල විසීමට වැඩි නැඹුරුවක් දක්වයි. පාරිසරික දූෂණයෙන් මිදී ග්‍රාමීය ප්‍රදේශයන් තුළ හිතකරව ජීවත් විය හැකිය. ඒ සඳහා හොඳම උදාහරණය කැනඩාවයි. සංවර්ධිත ජාතීන් විශාල වැසි වනාන්තර විනාශ කරන යුගයක කැනඩාව ඒවා ආරක්ෂිතව පවත්වාගෙන යයි. එසේ නමුත් කැනඩාවේ දක්ෂිණ ප්‍රදේශයෙහි බහුල වශයෙන් සල්ෆර් ඩයොක්සයිඩ් මුදා හරියි. මෙනිසා ඇතිවන හානිකර තත්ත්වයන්ට මුහුණදීමට ඔවුනට සිදු වනු ඇත.

අධ්‍යාපනය, විනෝදය, ඉහළ ජීවන රටාව, දිගුකල් ජීවත්වීම, දීප්තිමත් අනාගතය මිනිසුන්ගේ සිහින යි. මෙකී කාරණා ඉටු කර ගැනීමේ දී රටක පවතින සම්පත් උඩුයටිකුරු වී විනාශමුඛයට පත් වේ. මේ පිළිබඳ ඔවුන් ගේ අවධානය යොමු විය යුතු ය. අංක 03 හි සිටින නෝර්වේ රාජ්‍යය පරිසරයේ ඇති වැදගත්කම වටහා ගත් බව පෙනෙයි. මෙය රටක පාලන ආණ්ඩුව මඟින් නිසියාකාරව මෙහෙයවිය යුතු සංකල්පයකි.

අංක 84 හි සිටින චීනයෙහි, ඇමරිකාවම සාපේක්ෂව, කාර් බිලියනයක් මහා මාර්ගයන් හි ධාවනය කෙරෙයි. 1970 දී ඔවුන් ගේ ගෑස් පරිභෝජනය වාර්ෂිකව ලීටර් බිලියනයකි. වර්තමාන ලෝකයේ ම භාවිතාවන ප්‍රමාණයෙන් එය හරි අඩකි.

චීනයේ බීජිං නගරයේ වායු දූෂණය ඇමරිකාවේ නිව්යෝර්ක් මෙන් හතර ගුණයකි. මේ පිළිබඳ සැලකිලිමත් චීනය සිය "හරිත ඉලක්ක" සමුදායක් ඉදිරිපත් කරයි. ඒ අනුව ගල් අඟුරු ආශ්‍රිත කර්මාන්ත ශාලා 200 ක් උප නගර කරා ව්‍යාප්ත කිරීමෙන් සල්ෆර් මට්ටම අඩු කිරීමට ඔවුහු අපේක්ෂා කරති.

මේ අනුව සංවර්ධිත රටවල්, කඩිනමින්, සිය ඉන්ධන අවශ්‍යතා විකල්ප බලශක්ති ප්‍රභවයන් ඔස්සේ සපුරා ගත යුතු බවට ලෝක පාරිසරික කළමනාකරණ සංවිධාන දන්වා සිටියි.

**රීඩර්ස් ඩයිජෙස්ට් ඇසුරෙනි**

**ඉන්දික විජේසිංහ**